# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.12.04 පැය 0545 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/2166/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. ද්විත්ව මනුෂ්‍ය ඝාතනයක් සිදු කර තවත් කාන්තාවකට බරපතල තුවාල සිදු කිරීම - නොරොච්චෝල පොලිස් වසම.**

2025.12.03 වන දින රාත්‍රී කාලයේ නොරොච්චෝලේ පොලිස් වසමේ නාවක්කාඩුව ප්‍රදේශයේදී පුද්ගලයෙකු විසින් තියුණු ආයුධයකින් පහරදීම හේතුවෙන් පිරිමි පුද්ගලයෙකු හා කාන්තාවන් දෙදෙනෙකු බරපතල තුවාල ලබා පුත්තලම රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පිරිමි පුද්ගලයා හා එක් කාන්තාවක් මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 38 ක් සහ මරණකාරිය වයස අවුරුදු 35 ක් වූ නාවක්කාඩුව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

පුද්ගලික ආරවුලක් මත මෙම ද්විත්ව ඝාතනය සිදුකර ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. **වයස අවුරුදු 23 ක් වන නාවක්කාඩුව ප්‍රදේශයේ පදිංචි සැකකරු අත්අඩංගුවට** ගෙන ඇති අතර පොලිස් ආරක්ෂාව යටතේ පුත්තලම රෝහලේ ප්‍රතිකාර ලබයි. නොරෙච්චෝල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. මනුෂ්‍ය ඝාතනයක් - නාවලපිටිය පොලිස් වසම.**

2025.12.03 වන දින රාත්‍රී කාලයේ නාවලපිටිය පොලිස් වසමේ කැටබුලාව ප්‍රදේශයේදී බීමත්ව ඇතිවූ බහින් බස් වීමක් දුරදිග ගොස් පුද්ගලයන් දෙදෙනෙකු විසින් තියුණු ආයුධයකින් පහරදීම හේතුවෙන් පුද්ගලයෙකු බරපතල තුවාල ලබා නාවලපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට නාවලපිටිය පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 57 ක් වූ කැටබුලාව, නාවලපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අපරාධයට සම්බන්ධ **අවුරුදු 23 හා 28 වයස්වල පසුවන කැටබුලාන ප්‍රදේශයේ පදිංචි** සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඇති අතර නාවලපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකාරියක් අත්අඩංගුවට - බස්නාහිර පළාත් දකුණ දිසා අපරාධ කොට්ඨාසය.**

2025.12.03 වන දින දෙහිවල පොලිස් වසමේ හිල් වීදිය මාර්ගයේදී බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 100 ක් සමඟ සැකකාරියක් අත්අඩංගුවට** ගෙන ඇත.

**සැකකාරිය වයස අවුරුදු 29 ක් වන දෙහිවල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

බස්නාහිර පළාත් දකුණ දිසා අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - හෝමාගම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2025.12.03 වන දින පාදුක්ක පොලිස් වසමේ මාදුලාව ප්‍රදේශයේදී හෝමාගම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධි මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 2268 ක් (බැරල් 12) සහ පෙරීම් උපකරණ සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන පාදුක්ක පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 50 ක් වන මාදුලාව, පාදුක්ක ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පාදුක්ක පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. මාරක රිය අනතුරක් - පොතුහැර පොලිස් වසම.**

2025.12.03 වන දින උදෑසන කාලයේ පොතුහැර පොලිස් වසමේ පොතුහැර වදාකඩ මාර්ගයේ අහුගොඩ පාලම ආසන්නයේදී පොතුහැර දෙසට ධාවනය වූ යතුරුපැදියක් ප්‍රතිවිරුද්ධ දිසාවෙන් පැමිණි තවත් යතුරුපැදියක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු හා අනෙක් යතුරුපැදියේ පැදිකාරිය බරපතල තුවාල ලබා කුරුණෑගල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු යතුරුපැදිකාරිය මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 51 ක් වූ මහපිටිය, පොතුහැර ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පොතුහැර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. මාරක රිය අනතුරක් - නිට්ටඹුව පොලිස් වසම.**

2025.12.03 වන දින සවස් කාලයේ නිට්ටඹුව පොලිස් වසමේ කොළඹ මහනුවර ප්‍රධාන මාර්ගයේ මක්කණිගොඩ හන්දිය අසලදී මහනුවර දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කරගත නොහැකිව මාර්ගයේ පෙරළී ගොස් අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු බරපතල තුවාල ලබා වතුපිටිවල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 61 ක් වූ වේවැල්දෙණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වතුපිටිවල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර නිට්ටඹුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. මාරක රිය අනතුරක් - පොල්ගහවෙල පොලිස් වසම.**

2025.12.03 වන දින රාත්‍රී කාලයේ පොල්ගහවෙල පොලිස් වසමේ කොළඹ කුරුණෑගල මාර්ගයේ කහවත්ත ඇල හන්දිය ආසන්නයේදී කොළඹ දෙසට ධාවනය වූ ලොරි රථයක් මාර්ගය හරහා ගමන් කල පදිකයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පදිකයා බරපතල තුවාල ලබා කුරුණෑගල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.**

මෘත ශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරින් පසු ලොරි රථ රියදුරු පලාගොස් ඇති අතර අත්අඩංගුවට ගැනීම සඳහා පොල්ගහවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**